# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1යි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට 1, 2, 3, 4 ලෙස ලබා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි හෝ ගැළපෙන වරණය තෝරන්න.
- ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරේ අංකයට අදළ කවය මත සලකුණ යොදන්න.

---

01) ලංකාවට නොපැමිණ ලංකාව පිළිබඳව තොරතුරු රචනා කළ පෘතුගීසි ජාතිකයාගේ නම වන්නේ
1) ප්ලිනි 2) රිබෙයිරෝ
3) ෆර්නා ඕ ඩී ක්වයිරෝස් පියතුමා 4) ෆිලිප්පස් බැල්ඩියස්

02) ගල්පොත සෙල්ලිපිය කරවූ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා අයත් වන රාජ වංශය වන්නේ
1) කාලිංග 2) පාණ්ඩ්‍ය 3) මෞර්ය 4) ලම්බකරණ

03) මෙහි පහත දැක්වෙන ප්‍රාග් ඓතිහාසික ස්ථාන අතරින් ලංකාවේ වඩාත් පැරණිතම ප්‍රාග් ඓතිහාසික සාක්ෂි හමුවන ස්ථානය සහිත වරණය තෝරන්න.
1) බුන්දල 2) පාහියංගල
3) කුරුවිට බටදොඹ ලෙන 4) පතිරාජවෙල

04) ලංකාවේ මැටි ඔරු සුසාන භූමියක් පවතින ස්ථානයක් සඳහා උදාහරණයක් නොවන්නේ
1) යටිගල්පොත්ත 2) රංචාමඩම 3) බෙරගල 4) හල්දුම්මුල්ල

05) උඩ රංචාමඩමෙන් සොයාගත් වර්ණාලේපිත මැටි බඳුනට සමාන තවත් මැටි බඳුනක් හමු වී ඇති පූර්ව ඓතිහාසික ජනාවාසය වන්නේ
1) රංචාමඩම 2) හල්දුම්මුල්ල 3) බෙරගල 4) ඉබ්බන්කටුව

06) පහත සඳහන් A හා B තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුරට හිමි වරණය තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| i. | ගෝපාලගාම | A. | අත්හැර දමූ වැව්ගම |
| ii. | ඔලගම් | B. | වෙළඳ ගම් |
| iii. | වඩ්ඩිකීගාම | C. | ගවපාලකයින් විසූ ගම් |
| iv. | නියම් ගම් | D. | වඩුවන් විසූ ගම් |

1) A B D C 2) C A B D 3) C A D B 4) A C D E

07) සුමනගේ පවුලට අයත් ලෝහ වැඩ සිය රැකියාව ලෙස කළ ගෘහපතියෙකු භික්ෂූන් වහන්සේලා උදෙසා ගල් ලෙනක් පූජා කළ බව දැක්වෙන තොරතුරු සඳහන් වන සෙල්ලිපිය තෝරන්න.
1) යටහලෙන 2) කොත්ගල් කන්ද
3) සිතුල් පව්ව 4) පෙරිය පුලියන් කුලම

08) වියළි කලාපයේ "එල්ලංගා පද්ධතියක්" නිර්මාණය කරගැනීමට හේතු වූ ප්‍රධාන කරුණක් නොවන්නේ
1) වියළි කාලගුණයට මුහුණ දීම
2) විනාශකාරී ගංවතුර පාලනය කිරීම
3) වැඩිවන ජනගහනයට අවශ්‍ය ජල අවශ්‍යතා සැපිරීම
4) වැඩි වන ජනගහනයට වැඩියෙන් ආහාර නිෂ්පාදනය කිරීමට

09) ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීම නිසා ලද ප්‍රධානම ප්‍රතිලාභය වන්නේ
1) වැව් අමුණු තැනීමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම නිසා ගොවිතැන දියුණු වීම
2) විධිමත් නායකයෙකු යටතේ වෙළඳාම දියුණු වීම
3) ස්වාධීන රටක් ලෙස ලංකාවට ලෝකය හමුවේ පෙනී සිටීමට හැකිවීම
4) ඉහත සඳහන් සියල්ලම

10) I වන විජයබාහු රජු සිය පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීමට බලපෑ වැදගත්ම හේතුව වන්නේ
1) අනුරාධපුර රාජධානියට වඩා පොළොන්නරු රාජධානිය ආරක්ෂිත වීම
2) ඒ වනවිටත් පොළොන්නරුවේ වැව් අමුණු හා පර්යන්ත මාළිගා ඉදිකර තිබීම නිසා සැලසුණු පහසුව
3) චෝල ආක්‍රමණ නිසා අනුරාධපුරය අගනුවර විනාශ වී තිබීම
4) ඉන්දියන් සාගරයේ ඇති වූ නව වෙළඳ ප්‍රවණතා වෙනුවෙන් ගෝකණ්ණ තිත්ථ වරාය සක්‍රීය කර ගැනීම.

11) පහත සඳහන් නිලධාරීන් අතීතයේ හැඳින්වූ තනතුරු නාමය සමඟ නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B |
|---|---|---|
| i. | රජතුමාට වත් සිරිත් දැනුම් දුන් නිලධාරියා | A. කණපෙඩික |
| ii. | නගරයේ වාස්තු ශිල්පියා | B. කොතුරුගෑනා |
| iii. | රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානියා | C. පනඅදෙක |
| iv. | වෙළඳ කටයුතු භාර ප්‍රධානියා | D. නගරවුඩික |

1) B D A C    2) B A C D    3) B D C A    4) A B C D

12) ක්‍රි.ව. 9 වන සියවසේ සෙල්ලිපිවල දසගම් ඇත්තන් ලෙස හඳුන්වා ඇත්තේ
1) ගම් නායකයින්ගේ එකමුතුවක්
2) විහාරස්ථාන සඳහා දනය පිරිනැමූ ගම් නායකයින්
3) ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩල
4) පරුමකවරුන් දහයකගේ එකතුවක්

13) "කෙටු කනබ කැති අඩ" යන බදු වර්ග දෙක අහෝසි කළ රජතුමාගේ නම තෝරන්න.
1) මහා පරාක්‍රමබාහු රජු    2) වසභ රජු
3) නිශ්ශංකමල්ල රජු    4) IV වන උදය රජු

14) හම්බන්තොට දිස්ත්‍රික්කයේ "නැට්ටුකන්ද" නම් ස්ථානයේ ඇති සෙල්ලිපියේ සිත්තරුන් හැඳින්වීමට යෙදූ නාමය වන්නේ
1) ලපන    2) චිතකර    3) චිත්‍රකාර    4) සිත්තර

15) "කිතබ් - අල් - මස්ලික්වාල් - මමාලික්" යන අරාබි ග්‍රන්ථයේ ලංකාව හඳුන්වා ඇත්තේ මෙනමිනි.
1) රත්නදීප    2) රතුකැට දිවයින
3) තැප්‍රොබේන්    4) සෙරන්ඩිබ්

16) ලංකාවේ නිවාස ඉදිකිරීමේ තාක්ෂණය අතීතයට ගෙන යමින් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් බැම්මක් පිළිබඳව සාක්ෂි හමුවන ස්ථානය වන්නේ

1) කිතුල්ගල බෙලි ලෙන
2) පාහියන්ගල
3) කුරුවිට බටදොඹලෙන
4) සීගිරිය පොතාන

17) අතීතයේ "ධරණ" යන මිනුම් ඒකකය භාවිතා කර ඇත්තේ කුමක් මැනීම සඳහා ද?

1) කාලය
2) අවකාශය
3) දුර
4) බර

18) සිතුල්පව්ව සෙල් ලිපියට අනුව අධිකරණයකින් අයකරන දඩ මුදල් ඒ අසල පිහිටි බෞද්ධ විහාරස්ථානයක නඩත්තුවට පූජාකළ රජතුමා වන්නේ

1) IV වන උදය රජු
2) I ගජබා රජු
3) ආමණ්ඩ ගාමිණී අභය රජු
4) IV වන මිහිඳු රජු

19) පහත සඳහන් කරුණු වලින් හෙළිවන වඩාත් වැදගත් තොරතුරු සහිත වරණය තෝරන්න.

- පාණ්ඩ්‍ය වංශික ලීලාවතී බිසව තුන්වතාවක් පොළොන්නරුවේ රජ වීම.
- චෝඩගංග, සාහස්ස මල්ල, කල්‍යාණවතී රැජිණ ආදී කාලිංග වංශිකයින් වරින්වර පොළොන්නරුවේ රජවීම.

1) ලීලාවතී රැජිණගේ බලවත් භාවය
2) පොළොන්නරු රාජධානියේ දේශපාලන නිදහස
3) පොළොන්නරු රාජධානියේ පැවති කාන්තා නිදහස
4) කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර පැවති බල අරගලය

20) පහත සඳහන් තොරතුරු සම්බන්ධව සලකා බලා එම සිදුවීම් වලට අදාළ රජතුමාගේ නම තෝරන්න.

- ජයබාහු කුමරු පරාජය කර කෝට්ටේ සිහසුන ලබා ගැනීම.
- "සිංහල සංගෙ" නම් කැරැල්ලකට මුහුණ දීම.
- VII වන පරාක්‍රමබාහු රජුගේ පියා වීම.

1) VI වන පරාක්‍රමබාහු රජු
2) VII වන වීර පරාක්‍රමබාහු රජු
3) VII බුවනෙකබාහු රජු
4) VI වන බුවනෙකබාහු රජු

21) ගම්පොල රාජධානි සමයේ විසූ කෙනෙකුට දැනගන්නට නොලැබෙන සිද්ධිය සහිත වරණය තෝරන්න.

1) ගාල්ලේ ත්‍රිභාෂා සෙල්ලිපිය කරවීම
2) පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම
3) සපුමල් කුමරු විසින් යාපා පටුන ජයගැනීම
4) I වෙනි බුවනෙකබාහු රජු නව රාජධානියක් පිහිටුවීම

22)

A. නීත්‍යානුකූල රාජ්‍ය උරුමය නොමැතිවීම.
B. ලන්දේසීන් සමඟ ගැටුම් ඇති කර ගැනීමට සිදුවීම.
C. වැලිවිට අසරණ සරණ සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් කීර්ති ශ්‍රී රාජසිංහ රජු සම්බන්ධයෙන් වන සත්‍ය අසත්‍ය භාවය විමසන්න.

1) A හා B සත්‍ය වන නමුත් C අසත්‍ය වේ.
2) B හා C සත්‍ය වන නමුත් A අසත්‍ය වේ.
3) A හා C සත්‍ය වන නමුත් C අසත්‍ය වේ.
4) ප්‍රකාශයන් තුනම සත්‍ය වේ

23) "නූතන තාරකා විද්‍යාවේ පියා" ලෙස විරුදාවලිය දරණ විද්‍යාඥයාගේ නම තෝරන්න.

1) නිකලස් කොපර්නිකස්
2) ජොහැන්නස් කෙප්ලර්
3) අයිසෙක් නිව්ටන්
4) ගැලීලියෝ ගැලිලි

★ **පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරින් 24, 25 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A- පැලැද බලකොටුවක් ඉදිකිරීම.

B- සීතාවක තර්ජන නිසා කෝට්ටේ නගරය අතහැර කොළඹ කොටුවේ පදිංචි වීම.

C- කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට තෑගි ඔප්පුවක් මගින් ලබාදීම.

D- යාපන රාජ්‍යයේ දී ගැටුමක් ඇති වී මරණයට පත්වීම.

24) වීදියේ බණ්ඩාර සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරු යුගලය තෝරන්න.

1) A හා C　　2) B හා D　　3) A හා D　　4) B හා C

25) දෙන් ජුවන් ධර්මපාල රජු සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරු යුගලය තෝරන්න.

1) A හා B　　2) B හා C　　3) A හා C　　4) B හා C

★ **පහත සඳහන් වගුව ඇසුරින් 26 හා 27 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| **නිර්මාණකරු** | **වර්ෂය** | **නිර්මාණය** |
|---|---|---|
| A) සැමුවෙල් මෝස් | D) 1811 | G) විදුලි පණිවිඩ ක්‍රමය |
| B) හෙන්ඩ්‍රි බේල් | E) 1814 | H) වාෂ්ප දුම්රිය එන්ජිම |
| C) ජෝර්ජ් ස්ටීවන්සන් | F) 1844 | I) දුම් නැව |

26) පණිවිඩ හුවමාරුවට අදළ කාර්මික විප්ලවයේ නිර්මාණය සම්බන්ධ තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

1) B, E හා H　　2) A, F හා G　　3) B, ෙ හා G　　4) A, E හා G

27) සාගර ප්‍රවාහනයට අදළ කාර්මික විප්ලවයේ සොයාගැනීමට අදල තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

1) B, D, හා I　　2) A, F හා I　　3) C, D හා I　　4) B, F හා I

28) ඉන්දියාවේ දී ප්‍රංශවරුන් විසින් අල්ලාගත් නගරයක් නොවන පිළිතුර තෝරන්න.

1) පොන්ඩිචෙරි　　2) කල්කටා　　3) කරිකාල්　　4) චන්දනගර්

29) ක්‍රි.ව. 1795 දී ලංකාවේ ලන්දේසීන් පලවා හැර රාජාධි රාජසිංහ රජු මුණගැසුණු ඉංග්‍රීසි දූතයාගේ නම තෝරන්න.

1) රොබට් ඇන්ඩෲස්　　2) හියුබොයිඩ්

3) ජෝන් පයිබස්　　4) විලියම් හෝකින්ස්

30) පහත සඳහන් ප්‍රකාශයන්ට සම්බන්ධ ස්වාමීන් වහන්සේගේ නම තෝරන්න.

- කොටහේන දීපදුත්තාරාමයේ වැඩ සිටීම.
- බෞද්ධ ආගමික පුනරුදය සඳහා සහය දුන් ඕල්කට් තුමාගේ අවධානය දිනාගත් වාදයේ පුරෝගාමී නායකයා වීම.

1) වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි　　2) හික්කඩුවේ සුමංගල හිමි

3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි　　4) රත්මලානේ ධර්මාලෝක හිමි

31) සැලසුම, තාක්ෂණය හා අලංකරණය යන කරුණු අතින් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම නාගරික උද්‍යානය ලෙස සැලකෙනුයේ

1) සීගිරි උද්‍යානය　　2) රන්මසු උයන

3) මහමෙවුනා උයන　　4) දීප උයන

32) මව් පාර්ශවයෙන් රාජ්‍ය උරුමය ලැබීමේ ක්‍රමය පැවති රාජධානි යුගය වන්නේ
1) දඹදෙණිය 2) යාපහුව 3) ගම්පොළ 4) කෝට්ටේ

33) මහා විහාරයට අනුබද්ධ පිරිවෙනක් නොවන්නේ
1) සුන්හාත පිරිවෙන 2) විද්‍යාලංකාර පිරිවෙන
3) මරුගන පිරිවෙන 4) දික්සඳ සෙනෙවියා පිරිවෙන

34) ප්‍රථම වරට ව්‍යවස්ථාදයක සභාවට ඡන්ද බලයෙන් නියෝජිතයෙක් පත්කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ
1) ඩොනමෝර් 2) මැනිං 3) කෲව් මැකලම් 4) කෝල්බෲක්

35) ලංකා ජාතික සංගමය පිහිටුවීමෙන් අනතුරුව එහි පළමු සභාපති ධූරයට පත්වූයේ
1) පොන්නම්බලම් අරුණාචලම් මහතා 2) පොන්නම්බලම් රාමනාදන් මහතා
3) ඩී. බී. ජයතිලක මහතා 4) ඩී. එස්. සේනානායක මහතා

36) ලංකාවේ ද්‍රවිඩ කම්කරු ජනතාව වෙනුවෙන් නායකත්වය ගනිමින් කම්කරු අයිතීන් වෙනුවෙන් පෙනී සිටි නායකයා වන්නේ
1) නඩේස අයියර් මහතා 2) A.E. ගුණසිංහ මහතා
3) N.M. පෙරේරා මහතා 4) ඔරාබිපාෂා මහතා

37) 1949 දී ෆෙඩරල් පක්ෂය පිහිටුවීමට පුරෝගාමී වූ නායකයා වන්නේ
1) පොන්නම්බලම් රාමනාදන් මහතා 2) G.G. පොන්නම්බලම් මහතා
3) S.J.V. චෙල්වනායකම් මහතා 4) පොන්නම්බලම් අරුණාචලම් මහතා

★ **පහත** A, B, C, D **ප්‍රකාශ යුගලවල එක් එක් ප්‍රකාශ යුගලයේ පළමු හා දෙවන ප්‍රකාශය අත ඇති සම්බන්ධය සලකා බලා 38, 39, 40 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A) | 1) මොල්ලිගොඩ අධිකාරම් | 2) 1818 නිදහස් අරගලය |
| B) | 1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණය | 2) 1848 නිදහස් අරගලය |
| C) | 1) මියුරන් කමිටුව | 2) 1797 මුහුදුබඩ ප්‍රදේශවල කැරැල්ල |
| D) | 1) පොල්ගස් බද්ද | 2) ටොරින්ටන් ආණ්ඩුකාරවරයා |

38) දෙවැන්න ඇතිවීම සඳහා පළමුවැන්න මූල බීජය වූ ප්‍රකාශ යුගලය තෝරන්න.
1) A 2) B 3) C 4) D

39) දෙවැන්න අසාර්ථක කිරීමට පළමුවැන්න හේතු වූ ප්‍රකාශ යුගලය තෝරන්න.
1) A 2) B 3) C 4) D

40) දෙවැන්නට විසඳුම් දීමට පළමුවැන්න ක්‍රියාකළ ප්‍රකාශ යුගලය තෝරන්න.
1) A 2) B 3) C 4) D